සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

## දෙවන වාර ඇගයීම
## Second term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

* **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* **II** කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

### I කොටස

❖ අංක 01 සිට 20 දක්වා සියලු ම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) අතීතයේ සෙල්ලිපිවල "පිටබිම්" යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(1) ගොවිබිම් ය. (2) හේන් ය. (3) කුඹුරු ය. (4) පිටස්තර බිම් ය.

(02) අතීත ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් පහත කුමන නමකින් හඳුන්වා ඇත් ද?

(1) කුඹල්ලු (2) මණිකර (3) පෙහෙකාර (4) තඹකර

(03) ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ දී වැදගත් වූ ස්වාභාවික පැරණි වරායක් වූයේ කුමක් ද?

(1) ගෝකණ්ණ (2) කොළොම්තොට (3) ගාල්ල (4) මාගම්පුර

(04) මානවම්ම කුමරුන් ආරක්ෂාව පතා පලා ගියේ ඉන්දියාවේ කුමන රාජ්‍යය වෙත ද?

(1) චෝල (2) කාලිංග (3) කේරළ (4) පල්ලව

(05) පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීමට දක්ෂ සෙන්පතියකු වූ කුට්ඨක සෙනෙවියාගේ ප්‍රධානත්වයෙන් යුත් බලවත් හමුදාවක් යැවූ රජතුමා වන්නේ,

(1) I සේන රජු ය. (2) II සේන රජු ය. (3) මානවම්ම රජු ය. (4) දාඨෝපතිස්ස රජු ය.

(06) මානවම්ම රජ පෙළපතේ පාලන අවධිය වන විට රට තුළ මනා මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් පැවතිබවට සාක්ෂි හමුවන ඓතිහාසික මූලාශ්‍රය කුමක් ද?

(1) වේවැල්කැටිය සෙල්ලිපිය (2) මහාවංසය

(3) මිහින්තලා පුවරු ලිපිය (3) පනාකඩුව තඹ සන්නස

(07) නිශ්ශංකමල්ල රජතුමා ජනතා විශ්වාසය දිනා ගනිමින් කටයුතු කර ඇති බව තහවුරු කිරීමට උපයෝගී කර ගත හැකි සෙල්ලිපියක් නොවන්නේ පහත කුමක් ද?

(1) දෙවනගල සෙල්ලිපිය (2) ගල්පොත ශිලා ලිපිය

(3) හැටදාගෙය ශිලා ලිපිය (3) දඹුලු පර්වත ලිපිය

(08) අනුරාධපුර රාජධානිය බිඳ වැටුණේ පහත කවර දකුණු ඉන්දීය රාජ්‍යය එල්ල කළ ආක්‍රමණවලින්ද?

(1) පල්ලව (2) චෝළ (3) කාලිංග (4) කේරළ

(09) අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා හා දානශාලා පිහිටවූ රජතුමා වූයේ,

(1) පණ්ඩුකාභය රජ (2) I පරාක්‍රමබාහු රජ (3) නිශ්ශංකමල්ල රජ (4) I උපතිස්ස රජ

(10) තම ළමා කාලයේදී සිටම රුහුණේ සිත්නාරු බිම් බුදල්නාගෙන් උපකාර ලබාගෙන රජබවට පත්වූයේ,

(1) මානවම්ම රජතුමා ය. (2) V මිහිඳු රජතුමා ය.

(3) I විජයබාහු රජතුමා ය. (4) නිශ්ශංකමලල්ල රජතුමා ය.

(11) තෝපාවැව සහ දුඹුටුලු වැව ඒකාබද්ධ කිරීමෙන් නිර්මාණය කර ඇත්තේ පහත කුමන වැව ද?

(1) පරාක්‍රම සමුද්‍රය (2) තිසාවැව

(3) හුරුළු වැව (4) කන්තලේ වැව

(12) දුටුගැමුණු රජුගේ පුත් කුමාරයාට සාලිය යන නම තබන ලද්දේ, කුමාරයා උපන් කාලයේ ඇල් වී අස්වැන්න ඉහළ ගිය නිසා යැයි සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,

(1) සීහළවත්ථු (2) ජාතක කථා පොත

(3) රාජාවලිය (4) දීපවංසය

(13) චෝළ පාලනයෙන් රට මුදවාගෙන ලාංකිකයන්ගේ අභිමානය නැවත ගොඩ නගන ලද්දේ,

(1) මහා පරාක්‍රමබාහු රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.

(3) නිශ්ශංකමල්ල රජතුමා ය. (4) මහා විජයබාහු රජතුමා ය.

(14) පරාක්‍රමබාහු කුමාරයාගේ උප්පත්තිය සිදු වූ ස්ථානයේ තනවා ඇති චෛත්‍ය පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) මිරිසවැටි චෛත්‍ය (2) දැදිගම කොටවෙහෙර

(3) මාළිගාවිල චෛත්‍ය (4) කිරිවෙහෙර

(15) පොළොන්නරුවේ සිය බලය පිහිටුවා ගැනීමේ දී පරාක්‍රමබාහු රජුට අභියෝගයක් වූ රුහුණේ හමුදාවට නායකත්වය ලබාදුන් බිසව වන්නේ,

(1) ලීලාවතී (2) කල්‍යාණවතී (3) සුගලා (4) මිත්තා

(16) ලෝක සංස්කෘතික උරුමයක් ලෙස යුනෙස්කෝ සංවිධානය නම් කර ඇති මොහොන්ජොදාරෝ නගරය වර්තමානයේ අයත් රට කුමක් ද?

(1) ඉන්දියාව (2) ඉරාකය (3) චීනය (4) පකිස්ථානය

(17) වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියට පත් දකුණු පළාතට අයත් නගරයකි.

(1) අම්බලන්ගොඩ (2) කතරගම (3) මාතර (4) හික්කඩුව

(18) පැරණි හින්දු පොත්පත්වල සඳහන් "විද්‍යාරම්භ" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(1) උපතේදී සිදු කළ සිරිත් විරිත් (2) අධ්‍යාපනය ඇරඹීම

(3) කන් විදීම (4) නම් තැබීම

(19) අතීතයේ පැවති නැටුම්, ගැයුම් ආදී කලා කටයුතු තවමත් රැකී ඇති අවස්ථාවකට උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ,

(1) පොසොන් පෙරහැර (2) වෙසක් උත්සවය

(3) ඇසළ පෙරහැර (4) ජන කවි හා නාට්‍ය

(20) අපි අපේ සංස්කෘතික උරුම රැක ගත යුතු වන්නේ,

(1) ඒවා විදේශ රටවලට විකුණා මුදල් උපයා ගැනීම සඳහා ය.

(2) විනෝද ගමන් සංවිධානය කිරීම සඳහා ය.

(3) රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා ය.

(4) ශ්‍රී ලාංකික අනන්‍යතාව ලෝකය හමුවේ පෙන්වීමටත් අපේකම රැකගැනීමටත් ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

*** පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

*** අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.**

*** පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) (I) පහත A, B, C, D වලින් අසා ඇති කෙටි ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A. හේන් ගොවිතැනේ දී භාවිත කරන නවදැලි හේන යනු කුමක් ද?

B. ගොයම් මැඩීම යන්නෙන් අදහස් කළේ කුමක් ද?

C. අතීතයේ ප්‍රවාහන කටයුතුවට යොදාගත් ගවයින් හඳුන්වා ඇත්තේ කිනම් නමකින්ද?

D. ලංකාවේ භාවිතා වූ මුල්ම කාසි විශේෂය නම් කරන්න. (ලකුණු 04)

(II) පහත A, B යටතේ දැක්වෙන පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



(i) මෙම පින්තූරයෙන් දැක්වෙන සංස්කෘතික උරුමය නම් කරන්න.

(ii) එය පිහිටි රට ලියන්න. (ලකුණු 04)

B



(i) මෙම පින්තූරයෙන් දැක්වෙන ස්ථානය නම් කරන්න.

(ii) මෙම උයන ඇත්තේ කිනම් නගරයේ ද?

(ලකුණු 04)

(III) පහත ලංකා සිතියමේ D, E, F, G අක්ෂරවලින් දක්වා ඇති ස්ථාන හඳුනාගෙන අනුපිළිවෙලින් ලියන්න.




D - ..................................

E - ..................................

F - ..................................

G - ..................................

(ලකුණු 04)

(02) (i) අතීතයේ දී ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ ගනුදෙනු කළ රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) විදේශීය රටවලින් මෙරටට ගෙන ආ භාණ්ඩ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) A. වෙළෙඳපළ පාලනය පිළිබඳ නීති සඳහන් බදුලු ටැම් ලිපිය පිහිටුවන ලද රජතුමා නම් කරන්න. (ලකුණු 02)

B. එහි සඳහන් නීති තුනක් ලියන්න. (ලකුණු 03)

(03) (i) අනුරාධපුර යුගයේ වැඩි කාලයක් මෙරට පාලන බලය දරන ලද රජ පෙළපත් දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අනුරාධපුර යුගයේ දී බහුල වශයෙන් රජකම උරුම වූ ක්‍රම දෙක ලියන්න. (ලකුණු 04)

(iii) අතීතයේ රජතුමාගෙන් රටවැසියා බලාපොරොත්තු වූ කාර්යයන් දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) රාජ්‍ය පාලන කටයුතුවල දී රජුට සහාය වූ නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) අනුරාධපුර යුගයේ සමාජ සුබසාධනය පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ රජවරුන් දෙදෙනෙක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මහා විජයබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්ති දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) I විජයබාහු රජතුමා ගැන හැදෑරීමේ දී වැදගත්වන මූලාශ්‍රය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මහා පරාක්‍රමබාහු රජතුමා බුදු සසුනේ දියුණුවට කළ සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මහා පරාක්‍රමබාහු රජතුමා ආර්ථික සංවර්ධනය සඳහා කළ කාර්යයන් දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) අනුරාධපුර යුගයේ ශිලා ලිපිවල සඳහන් පහත නිලධාරීන් කවුරුන්දැයි හඳුන්වන්න.

A. අශ අදෙක B. අති අදික (ලකුණු 02)

(ii) පහත සෙල්ලිපිවලින් අනාවරණය වන තොරතුරු කෙටියෙන් ලියන්න.

A. සංගමු විහාර ලිපිය B. දෙවනගල සෙල්ලිපිය (ලකුණු 04)

(iii) A. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග තුනක් ලියන්න. (ලකුණු 03)

B. නිශ්ශංකමල්ල රජතුමා විසින් ඉදිකළ ආගමික ගොඩනැගිලි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(07) (i) අස්පෘශ්‍ය උරුම දෙකකට උදාහරණ දෙන්න. (ලකුණු 02)

(ii) යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම ලෙස නම් කර ඇති ශ්‍රී ලංකාවේ ස්ථාන හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) සීගිරිය බලකොටුවක් මෙන්ම විශිෂ්ඨ කලාගාරයක් ලෙස නම් කිරීමට බලපෑ හේතු දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)